අලව්ව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

---------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූලි 14 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

අංක 46-0524 දරන ට්‍රේලරයේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 07 කට අදාලව පැවති ශේෂයන් හා ඒවාට අදාල උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු. 4,329,523 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.361,400 ක් වටිනාකමැති ඉඩම් කට්ටි 14 ක් සඳහා හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි.

**1.3.4 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවන අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 16 වන වගන්තිය | දේපල ලියවිල්ලකින් හෝ වෙනත් විධිමත් ආකාරයකින් පවරා ගැනීමෙන් තොරව වැලිකතර සහ තිරිමානාපොළ සායන මධ්‍යස්ථානවලට විදුලිය ලබා ගැනීම සඳහා රු.43,000 ක් ගෙවා තිබුණි. |
| (ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| 218 රීතිය | නාරම්මල හා අලව්ව ප්‍රාදේශීය සභා බෙදා වෙන් කිරීමේදී අලව්ව ප්‍රාදේශීය සභාවට ලබා ගන්නා ලද ඉඩම් හා ගොඩනැගිලි භෞතිකව පරීක්ෂා කර පැවැත්ම සනාථ කර ගැනීමකින් තොරව ලබාගෙන තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ දින සිට මාස 06 ක් ඉක්ම වූ රු.38,670 ක චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | වාහන 10 කට අදාල දෛනික ධාවන සටහන් පත් නිසි පරිදි විගණනයට එවා නොතිබුණි. දෛනික ධාවන සටහන් පත් විගණනයට ඉදිරිපත් නොකළ කාලය තුළ ඉන්ධන ලීටර් 5675 ක් සඳහා රු.539,190 ක් වැයකර තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,349,140 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.80,822 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,429,962 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.3,138,299 ක් වූ මූලධන ආධාර හා රු.9,529,535 ක් වූ උපකරණ වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.2,957,904 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත | 13,656 | | | | | | |
| | ආදායම | | 12,306 | 1,350 | පෞද්ගලික | 50,045 | 35,436 | 14,609 |
| | | 59,608 | | | පඩිනඩි | | | |
| | වෙනත් | 73,264 | 35,304 | 24,304 | | 13,870 | 12,254 | 1,616 |
| (ii) | උප එකතුව | | 47,610 | 25,654 | අනෙකුත් | 63,915 | 47,690 | 16,225 |
| | | 3,138 | | | උප එකතුව | | | |
| | ප්‍රාග්ධන | 76,402 | 16,446 | (13,308) | | 9,529 | 18,730 | (9,201) |
| (iii) | ආදායම | | 64,056 | 12,346 | ප්‍රාග්ධන | 73,444 | 66,420 | 7,024 |
| | මුළු එකතුව | 9,349 | | | වියදම | | | |
| | මූල්‍ය ප්‍රතිඵලය | | (80) | 9,429 | මුළු එකතුව | 2,958 | (2,365) | 5,323 |
| | | | | | අතිරික්තය/ | | | |
| | | | | | ඌනතාවය | | | |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.73,264,099 න් සියයට 81 ක් හෙවත් රු.59,608,411 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය.

(ඇ) ප්‍රාග්ධන ආදායම වූ රු.3,138,299 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල්වලින් සමන්විත විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.63,914,959 න් සියයට 78 ක් හෙවත් රු.50,045,196 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 77 ක් හෙවත් රු.38,799,029 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ප්‍රාග්ධන වියදම වූ රු.9,529,535 න් සියයට 47 ක් හෙවත් රු.4,497,890 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබූ අතර ඉතිරි සියයට 53 ක් වූ රු.5,316,645 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම් සමඟ පහත පරිදි විය.

| | | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 3,244 | 2,767 | 1,403 | 8,015 | 3,127 | 1,138 |
| (ii) | බදුකුලී | 8,306 | 7,610 | 13 | 8,441 | 7,250 | 19 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 764 | 1,604 | - | 765 | 665 | - |
| (iv) | | 40,959 | 59,268 | 17,788 | 37,561 | 36,567 | - |
| | වෙනත් ආදායම් | 53,273 | 71,249 | 19,204 | 54,782 | 47,609 | 1,157 |
| | එකතුව | | | | | | |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම | එකතුව | ආදායම් රැස් කිරීම 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | හිඟහිටි ශේෂය 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු (000) | රු. (000) | රු.(000) | රු. (000) | රු. (000) | රු(000) | රු. (000) | රු. (000) | රු. (000) |
| වරිපනම් හා බදු | 1,138 | 3,031 | 4,169 | 309 | 2,219 | 2,528 | 829 | 812 | 1,641 |
| බදු කුලී | 19 | 7,604 | 7,623 | 11 | 7,598 | 7,609 | 8 | 6 | 14 |
| බලපත්‍ර ගාස්තු | - | 1,604 | 1,604 | - | 1,604 | 1,604 | - | - | - |
| වෙනත් ආදායම් | - | 59,268 | 59,268 | - | 59,268 | 59,268 | - | - | 17,788* |
| එකතුව | 1,157 | 71,507 | 72,664 | 320 | 70,689 | 71,009 | 837 | 818 | 19,443 |

* වැටුප් ප්‍රතිපූර්ණය බිල් නොකිරීම මත 2015 දෙසැම්බර් 31 දිනට හිඟය

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු. 1,862,125 ක්ද මුද්දර ගාස්තු රු.14,406,276 ක්ද විය.

(ආ) ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමෙන් සියයට 75 ක් හෙවත් රු.10,809,124 ක් 2013 වර්ෂයට අදාල විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.1,862,125 ක් වූ අතර එතුළ 2014 වර්ෂයට අදාල රු.194,625 ක්ද විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 36 ක් හෙවත් රු.493,878 ක වැඩිවීමක් ලැබිය යුතු උසාවි දඩවල පෙන්නුම් කෙරුණි.

### 2.3.4 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් ඒකක 4214 ක් සඳහා රු.1,972,741 ක් බිල්කර පැවති අතර 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟය රු.1,379,227 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට රජයේ හා අනුබද්ධ ආයතන තුනකින් රු.140,952 ක්ද, පුද්ගලික ආයතන හා පදිංචිකරුවන්ගෙන් රු.353,145 ක හිඟ වරිපනම් හා බදු වශයෙන් රු.494,097 ක මුදලක් කාර්තු 4 සිට 52 දක්වා කාලයක සිට අයවීමට තිබුණි.

(ඇ) සභාවට ගෙවිය යුතු වරිපනම් බදු මුදල් අදාල කාල සීමාව තුළ නොගෙවන විටදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) (ආ) වගන්තියේ විධිවිධාන පරිදි ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබූ බලපත්‍රයක් මත එකතු කිරීම් සිදුකළ යුතු වුවද, එසේ එකතු කර නොතිබුණි.

### 2.3.5 සම්ප්‍රේෂණ කුළුණ ගාස්තු

ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව ප්‍රදේශයේ ස්ථාපිත දුරකථන සංඥා කුළුණුවලට අදාලව පෙරසැරි ගාස්තු, අනුකූලතා සහතික නිකුත් කිරීම සම්බන්ධ ගාස්තු සහ අනවසර ඉදි කිරීම් සම්බන්ධව සභාවට අයකළ හැකි ගාස්තු අයකර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධන ඇගයීම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ත්‍රීරෝද ගාස්තු ආදායම රු.159,600 ක් විය.

(ආ) අලව්ව නගර ශාලාව අළුත්වැඩියා කිරීම ප්‍රමාද වීම නිසා සමාලෝචිත වර්ෂයේ නගර ශාලාව කුලියට දීමෙන් උපයාගත හැකිව තිබුණු කුලී ආදායම අහිමි වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් පරීක්ෂක තනතුරේ සේවය කරන නිලධාරීන් සිව් දෙනාගේ රාජකාරි ලැයිස්තු අනුව ඔවුන් විසින් වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ආයතන සමීක්ෂණය කිරීම, වරිපනම් නිවේදන බෙදා හැරීම, අනවසර ඉදි කිරීම් වාර්තා කිරීම ආදී රාජකාරිවලින් බොහෝ දුරට බැහැර වී තිබූ අතර වරිපනම්, වෙළඳ බලපත්‍ර හා කඩකුලී ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම් ඔවුන් විසින් සිදුකර තිබුණි. මෙකී මුදල් සභාවට පුද්ගලයින් පැමිණ ගෙවිය යුතු අතර ලේකම්වරයා විසින් නිකුත් කළ වරෙන්තුවක් මත පමණක් ක්ෂේත්‍රයේ ආදායම් රැස්කළ යුතු වුවත්, අදාල නිලධාරීන් එවැනි බල පැවරීමකින් තොරව වර්ෂය පුරාම ක්ෂේත්‍රයේ මුදල් එකතු කර තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සභාවට ලැබී තිබුණු රු.1,357,110 ක් වූ විවිධ තැන්පතු ශේෂ 82 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

විශ්‍රාම යාම, ස්ථාන මාරු වීම හා සේවයට නොපැමිණීම වැනි හේතු මත වර්ෂ 6 – 8 දක්වා කාල පරාසයක් තුළ අයනොවී පවතින සේවක ණය ශේෂය රු.119,378 ක් විය.

**3.4 හඳුනාගත් අලාභ**

සභාව සතු අංක PC-0366 දරන කැබ් රථය 2014 නොවැම්බර් 17 දින අනතුරට ලක්වී තිබුණි. එම වාහනය පුද්ගලික ආයතනයක් මඟින් රු.95,943 කට අළුත්වැඩියා කර ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් රු. 67,986 ක පමණක් ගෙවීම හේතුවෙන් සභාවට රු.27,957 ක මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි.

**04. යහ පාලනය හා ගිණුම්කටයුතු භාවය**

**4.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර පැවති රු. 1,421,278 ක් වටිනා වත්කම් දෙකක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ රු.550,000 ක වියදමින් මිලටගෙන තිබුණු ජංගම අලෙවි කුටි 10 න් රු.330,000 ක් වටිනා අලෙවි කුටි 06 ක් නිසි අරමුණ සඳහා භාවිතා නොකර සභා පරිශ්‍රයේ තබා තිබුණි.

**4.2 බේරුම් නොකළ බැරකම්**

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින් වෙනුවෙන් සභාව විසින් ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.8,020,699 ක්ව තිබුණි.

## 05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය